# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1864/40 - 2014 මැයි මස 28 වැනි බදාදා - 2014.05.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකුවේ නිවේදන

**විනිමය පාලන පනත යටතේ දැන්වීම (ලංකා ව්‍යවස්ථාදායක ප්‍රඥප්ති සංග්‍රහයේ 423 වැනි අධිකාරය)**

**විනිමය පාලන පනතේ 7 වන සහ 8 වන වගන්ති ප්‍රකාරව වූ අවසරය**

1. 2012 දෙසැම්බර් 20 දිනැති අංක ඃ 1789/34 දරන රජයේ (අති විශෙෂ) ගැසට් පත්‍රයේ විනිමය පාලන පනත යටතේ ප්‍රසිද්ධ කරන ලද දැන්වීම 2 වන ඡේදයට පසුව පහත සඳහන් නව ඡේද ඇතුළත් කිරීමෙන් සංශෝධනය කෙරේ.

"2 අ. සුදුසුකම් ලත් පුද්ගලයින් තනි පුද්ගලයින් වන්නේ නම්, බලයලත් වෙළෙන්දෙකුගෙන් අයදුම් කර හර පතක් ලබා ගැනීමට පහත සඳහන් පුද්ගලයන් සුදුසුකම් ලබති.

(අ) රැකියාවක්, ව්‍යාපාරයක් හෝ වෘත්තියක් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකව සිටින ශ්‍රී ලාංකික පුරවැසියෙකුට, එවැනි රැකියාවෙහි, ව්‍යාපාරයෙහි හෝ වෘත්තියෙහි නියැළෙන කාලය තුළදී ;

(ආ) ශ්‍රී ලංකාවෙන් පිටත ස්ථිරව වාසය කරන, අනේවාසික ආවෘත ගිණුමක් හෝ සංක්‍රමණික ආවෘත ගිණුමක් විවෘත කර ඇති ශ්‍රී ලාංකික පුරවැසියෙකු ;

(ඇ) රාජ්‍ය දූත විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හෝ රාජ්‍ය දූත රුපියල් ගිණුම් හිමියෙකු ;

(ඈ) අනේවාසික විජාතික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියෙකු ;

(ඉ) නේවාසික ආගන්තුක රුපියල් ජංගම ගිණුම් හිමියෙකු ;

(ඊ) විදේශීය ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ රුපියල් ගිණුම් හිමියෙකු ;

(උ) සුරැකුම්පත් ආයෝජන ගිණුම් හිමියෙකු ;

(ඌ) විශේෂ විදේශ ආයෝජන තැන්පතු ගිණුම් හිමියෙකු ;

(එ) අන්තර්ජාතික සේවා සැපයුම්කරුවන් සහ ඔවුන්ගේ සේවකයන් සඳහා වන විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්, සේවා නියුක්තිකයෙකු ලෙස පවත්වාගෙන යන පුද්ගලයෙකු ;

(ඒ) විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම් හිමියෙකු."

2. 2අ ඡේදයට පසුව පහත සඳහන් නව ඡේද ඇතුළත් කිරීමෙන් සංශෝධනය කෙරේ :
"2අඅ. 2අ ඡේදයේ අයිතම (ආ) සිට (ඒ) දක්වා ලැයිස්තුගත කර ඇති තනි පුද්ගලයෙකුට හර කාඩ්පතක් නිකුත් කරනු ලබන අවස්ථාවකදී, එම ගිණුමේ බැරට ඇති මුදල් මත එකී හර කාඩ් පත නිකුත් කළ හැක."

3. 2අඅ. ඡේදයට පසුව පහත සඳහන් නව ඡේද ඇතුළත් කිරීමෙන් සංශෝධනය කෙරේ :
"2අආ. 2අ ඡේදයේ දක්වා ඇති පරිදි තනි පුද්ගලයින්ට නිකුත් කර ඇති හර කාඩ් පතක් පහත දැක්වෙන නියමයන් හා කොන්දේසිවලට යටත්ව භාවිතා කළ යුතුය :

*(අ.)* ශ්‍රී ලංකාව තුළදී ශ්‍රී ලංකා රුපියල්වලින් ගෙවීමට අවසර ඇත.
*(ආ.)* පහත සඳහන් තැනැත්තන්ට හර කාඩ්පත් නිකුත් කර ඇති අවස්ථාවලදී පමණක් ඕනෑම කාරණයක් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තෙකුට ගෙවීමක් කිරීමට අවසර ඇත.

i. රාජ්‍ය දූත විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියෙකු ;
ii. අනේවාසික විජාතික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියෙකු ;
iii. සුරැකුම්පත් ආයෝජන ගිණුම් හිමියෙකු ;
iv. විශේෂ විදේශ ආයෝජන තැන්පතු ගිණුම් හිමියෙකු.

*(ඇ.)* පහත සඳහන් තැනැත්තන්ට හර කාඩ්පත් නිකුත් කර ඇති අවස්ථාවලදී ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තෙකුට, ජංගම ජාත්‍යන්තර ගනුදෙනුවක් සඳහා ගෙවීමක් කිරීමට අවසර ඇත.

i. සේවා නියුක්තිකයෙකු වශයෙන් පවත්වාගෙන යන අන්තර්ජාතික සේවා සැපයුම්කරුවන් සහ ඔවුන්ගේ සේවකයන් සඳහා වන විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සේවා නියුක්තිකයෙකු ලෙස පවත්වාගෙන යන පුද්ගලයෙකු ;
ii. විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුමක් පවත්වාගෙන යන පුද්ගලයෙකු ;
iii. රැකියාවක්, ව්‍යාපාරයක් හෝ වෘත්තියක් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකව සිටින ශ්‍රී ලාංකික පුරවැසියෙකුට, එවැනි රැකියාවෙහි, ව්‍යාපාරයෙහි හෝ වෘත්තියෙහි නියැළෙන කාලය තුළදී."

4. පහත ඡේදය ඇතුළත් කර 3 වන ඡේදය ඉවත් කිරීමෙන් සංශෝධනය කෙරේ.
"2 අ ඡේදයේ අයිතම (අ) යටතේ කාඩ්පතක් නිකුත් කර ඇති අවස්ථාවකදී හැර, කාඩ්පත් හිමියා වෙනත් රටකට විගමනය වන්නේ නම් හෝ විදේශ සේවා නියුක්තියක් සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැරව යන්නේ නම්, ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තෙකුට නිකුත් කර ඇති විද්‍යුත් මුදල් හුවමාරු කාඩ්පතක්, කාඩ්පත නිකුත් කළ බැංකුවට භාර දිය යුතුය."

5. 3 වන ඡේදයට පසුව පහත සඳහන් නව ඡේදය ඇතුළත් කිරීමෙන් සංශෝධනය කෙරේ.
"3 අ. හර කාඩ්පතක් හෝ ණය කාඩ්පතක් භාවිතා කර විදේශ මුදල් ලබා ගැනීමේ අවස්ථාවකදී කාඩ්පත් හිමියා විසින් එසේ ගත් මුදල් භාවිතා කොට ඇත්තේ (2) වන ඡේදයේ සහ (2අ ආ) ඡේදයේ අයිතම (ඇ) යටතේ අවසරලත් ගනුදෙනු සඳහා පමණක් බවට තහවුරු කළහැකි සාක්ෂි තබා ගත යුතුය".

6. (5) වන ඡේදය ඉවත් කොට පහත සඳහන් නව ඡේදය ඇතුලත් කිරීමෙන් සංශෝධනය කෙරේ.
"5. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මෙම නිවේදනයේ කාර්යය සඳහා

i. "බලයලත් වෙළෙන්දා" යන්නට විනිමය පාලන පනතේ දී ඇති අර්ථයම අදාළ වනු ඇත.

ii. "**විද්‍යුත් මුදල් හුවමාරු කාඩ්පත (EFTC)**" යන්නෙන් බැර, හර හෝ වෙනත් යම් ආකාරයක වටිනාකමක් මාරු කිරීම සඳහා භාවිතා කරන්නාට හැකියාව ලබා දෙන කාඩ්පතක් හෝ උපකරණයක් අදහස් වන අතර, එයට ණය කාඩ්පත්, හර කාඩ්පත් සහ විනිමය පාලන පනතේ විධි විධානයන්ට අනුකූලවන බවට බලයලත් වෙළෙඳුන් විසින් ගනුදෙනු විස්තර හඳුනාගත හැකි අවස්ථාවලදී වටිනාකම තැන්පත් කළ කාඩ්පත් ද ඇතුලත් වේ.

iii. "**හර කඩ්පත**" යන්නෙන් මුදල් ලබා ගැනීම සහ/හෝ භාණ්ඩ හා සේවා මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම සඳහා එම කාඩ්පත දරන්නා විසින් පවත්වාගෙන යනු ලබන ගිණුම සෘජුවම හර කළ හැකි කාඩ්පතක් අදහස් වේ.

iv. "**ණය කාඩ්පත**" යන්නෙන් කාඩ්පත් දරන්නා වෙත එය නිකුත් කරන්නා විසින් ප්‍රදානය කරන ලද ණය පහසුකමක් සහිත කාඩ්පත් දරන්නා විසින් භාවිතා කරන ලද ණය මුදල සම්පූර්ණයෙන් හෝ කොටසක් නියමිත දින හෝ ඊට පෙර ගෙවා නිම කල හැකි කාඩ්පතක් අදහස් වේ. නියමිත දිනට නොපියවන ලද ණය මුදලට නිකුත් කරන්නා විසින් පොලී හෝ වෙනත් ගාස්තු අය කරනු ලැබිය හැකිය.

v. "**පෞද්ගලික**" යන්නෙන් කාඩ්පත් හිමියාගේ, ඔහුගේ/ඇයගේ කලත්‍රයාගේ, ළමයින්ගේ සහ දෙමාපියන්ගේ ප්‍රයෝජනය සඳහා භාවිතා කිරීම අදහස් වන අතර එමගින් කාඩ්පත යම් වාණිජ කාර්යයක් සඳහා භාවිතා කිරීම අදහස් නොවේ."

පී. එච්. ඕ. චන්ද්‍රවංශ,
විනිමය පාලක.

වර්ෂ 2014 ක් වූ මැයි මස 28 වැනි දින,
කොළඹ දී ය.

06 - 344

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.